**සාමාජික ඔබගෙන් වැඩිපුර අයවූ ණය වාරික ආපසු ගෙවීමට සියල්ල සූදානම්.**

ඔබගේ පෞද්ගලික ජීවිතේ පැන නගින විවිධ ආර්ථික අවශ්‍යතාවයන් සම්පූර්ණ කර ගැනීම සඳහා මෙම අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් ඉල්ලුම් කරනු ලබන සියළුම ණය මුදල් පූර්ණ පරිගණක ගත ආකාරයෙන් ගෙවීමට 2013 වසරේ සිට ආරම්භ කර ඇති බැව් දැනුම් දෙන්නේ ඉමහත් සතුටිනි. ඒ අනුව අප සාමාජිකයින් විසින් 2012 වසරට පෙර ලබා ගත් සියළු ණය මුදල්ද පරිගණකය වෙත ඇතුළත් කිරිමට කටයුතු කරන ලදි. එසේ අතින් සකසා ගෙවන ලද සමහර ණය මුදල් සඳහා වැඩිපුර අයවුන වාරික ප්‍රමාණය නැවතත් ඔබ වෙත නොපමාව ගෙවීමට කටයුතු කරන බවට මෙම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සියළු ස්ථාන දැනුවත් කිරිමට කටයුතු කරන ලදි.

2013 වර්ෂය අවසානයේ පොළිය ගණනය කිරිම, ගිණුම් තුලනය කිරිම් සහ අවසාන ගිණුම් සැකසීම වැනි විශාල කාර්‍යභාරයක් මෙම අධ්‍යක්ෂක මණ්ඩල කාර්යය මණ්ඩලය වෙත පැවරී තිබු හෙයින් 2013 වර්ෂයේ දෙසැම්බර් මාසය තුලදී එසේ වැඩිපුර අයවූ ණය වාරික ඔබ වෙත නැවත ගෙවීමට නොහැකිවීම සම්බන්ධයෙන් කණගාටුව ප්‍රකාශ කර සිටිමු. එහෙත් එසේ වැඩිපුර අයවූ ණය වාරික සියල්ල 2014 වර්ෂයේ ජනවාරි මාසය අවසානයට පෙර ඔබගේ බැංකු ගිණුම් වෙත තැන්පත් කිරිමට අවැසි කටයුතු සියල්ල සකසා අවසන් බැව් සතුටින් ප්‍රකාශ කර සිටිමු.